කොළඹ විශ්වවිද්‍යාලයය, ශ්‍රී ලංකාව
නීති පීඨය

නීති අවසාන පරීක්ෂණය, සිව්වන වසර - ~~2019~~/2020
මානව හිමිකම් නීතිය

(පැය තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 07

ඕනෑම ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත් අකුරු වලට ලකුණු අඩු කරනු ලැබේ)

1. "1948 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කරගත් දා පටන් සිදුවන ක්‍රමික විකාශය තුළින් මානව හිමිකම් සංකල්පයෙහි පවතින සුවිශේෂී ස්වභාවය ප්‍රත්‍යක්ෂ වේ. එවන් වර්ධනයේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනයෙහි කෙටුම්පත්කරුවන් කිසිදා නොසිතූ මිනිසාට වැදගත් වන විවිධ අංශයන් ඔස්සේ සිදුවූ තේමාන්විත ප්‍රවේශයයි."

   මෑතකාලීනව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් දැඩි අවධානයක් යොමු කළ එවන් වූ මිනිසාට වැදගත් අංශයක් හඳුනාගෙන මානව හිමිකම් කතිකාවත තුළ එම අංශයෙහි ප්‍රවර්ධනය උදෙසා එක්සත් ජාතීන්ගේ සාමාජිකයන් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සාකච්ඡාකරන්න.

2. නීතිය ඉදිරියේ සමානාත්මතාවය ට ඇති අයිතිය සහ නීතියේ සම ආරක්ෂාව සියළුම වෙනස් ආකාරයේ සැළකීම් විභේදනයන් බවට පත් නොකරයි.

   ඉහත ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේ ද? දේශීය සහ අන්තර්ජාතික නඩු තීන්දු අධිකාරීන් ඇසුරෙන් ඔබේ පිළිතුර සනාථ කරන්න.

3. සුනිල් නීති විරෝධී මත්පැන් විකිණීමේ චෝදනාවට සැකකරුවෙකු ලෙස ෆාමිලන්ත පොලිසිය විසින් 2019 දෙසැම්බර් 31 වනදා අත්අඩංගුවට ගන්නා ලදී. එම චෝදනාව සුනිල් විසින් ප්‍රතික්ෂේප කළ කල්හි ඔහු ගේ දෑස් බැඳ බලහත්කාරයෙන් පොලිස් ජීප් රථයට නංවා ගන්නා ලදී. එවිට සුනිල් ගේ බිරිය මදාරා විසින් සුනිල්ව අත්අඩංගුවට ගැනීමට ලැබී ඇති වරෙන්තු බලපත්‍රය පෙන්වන මෙන් ඉල්ලා සිටි අතර ඇයව පසෙකට තල්ලු කර දමන ලදී. පොලිස් ස්ථානයේ දී පොලිස් පරීක්ෂණ සන්ද්‍ර බලා සිටියදී උප පොලිස් පරීක්ෂක බන්ඩු විසින් සුනිල්ගේ ඇඳුම් සියල්ල ඉවත් කර, කණුවකට බැඳ තබා පයිප්ප බටයකින් සහ රිටි වලින් පහර දෙන ලදී. විමර්ශනයේ දී ඔහුව තදබල කායික වධ හිංසාවන්ට ලක් කරන ලදී. ඔහුගේ නාසයෙන් රුධිරය වහනය වූ අතර තනිව එහා මෙහා ගමන් කිරීමට නොහැකි තත්වයක පත්විය. පසුදා උදෑසන ඔහුව ෆාමිලන්ත රෝහලට ඇතුළත් කරන ලදී. සුනිල්ගේ හිසට මැහුම් හයක් දමන ලද අතර අභ්‍යන්තරික ඉන්ද්‍රියයන් දැඩි අසාධ්‍ය තත්ත්වයක් පෙන්නුම් කරන ලදී. බලයලත් නිලධාරියා විසින් වෛද්‍යවරයාට කිසිවක් හෙළිදරව් නොකරන ලෙස සුනිල්ට තර්ජනය කළේය. සුනිල්ගේ සෞඛ්‍ය තත්වය සිහිසුන් කෝමා තත්ත්වයක් දක්වා පහත වැටිණ. වෛද්‍ය වාර්තා පෙන්වා දුන් පරිදි ඔහුගේ මොළයේ සෛල වලට

තදබල හානි සිදුවී ඇත.

ඔබ වධහිංසාවට ලක් වන්නන්ගේ අයිතීන් ආරක්ෂා කරන රාජ්‍ය නොවන සංවිධානයක නීතිඥ වරයාය. ෆාමිලන්තයේ නීති ක්‍රමය ලංකාවේ නීති ක්‍රමයට සමාන බව උපකල්පනය කරන්න. ෆාමිලන්ත මානව හිමිකම් රෙජිමය තුළ සුහිල්ට පවතින නෛතික ප්‍රතිකර්ම පිළිබඳව මදාරාට උපදෙස් දෙන්න.

4. එක්සත් මැකෝනියා රාජ්‍යයේ සුප්‍රසිද්ධ ස්වාධීන චින්තකයකු මෙන්ම සරණාගතයකුද වන සොබා ගේ සරණාගත ඉල්ලුම් පත්‍රය අසාර්ථක වීමෙන් පසුව, ස්වාතිලන්තයේ රාජ්‍ය දේශසීමා ඒජන්සිය විසින් රජයේ රැඳවුම් මධ්‍යස්ථානයක ඔහුව රඳවා තබා ගනියි. සොබා කොවිඩ්-19 වැළඳී ඇතැයි සැක සහිත නීති විරෝධී සංක්‍රමණිකයන් පිරිසක් සමග වහාම මැකෝනියා රාජ්‍යයට නෙරපා හැරීමට ඇති විකල්පය පිළිබඳව ස්වාතිලන්ත රාජ්‍ය දේශ සීමා ඒජන්සිය විසින් සළකා බලයි. මෙම ඒජන්සිය සහ ස්වාතිලන්ත සෞඛ්‍ය බලධාරීන් විසින් කිසිදු වෛද්‍ය පරීක්ෂාවකට භාජනය නොකර මෙවැනි නීති විරෝධී සංක්‍රමණිකයන් පිරිස් විවිධ රාජ්‍යයන් වෙත පිටත් කර යවා ඇත. මේ වන විටත් මැකෝනියා රාජ්‍යයේ ශ්‍රේෂ්ඨ ආගමික කවුන්සිලය මගින් රාජ්‍ය ආගම් විරෝධී ස්වාධීන අදහස් ප්‍රකාශ කිරීම අරභයා සොබා සහ ඔහුගේ අනුගාමිකයන්ට මරණීය දණ්ඩනය ප්‍රකාශයට පත් කර ඇත. මේ අතරතුර මැකෝනියා රාජ්‍යය තුළ කොවිඩ්-19 පාලනය අසාර්ථක වී ඇති අතර දිනෙන් දින කොවිඩ්-19 වැළඳුන රෝගීන් සංඛ්‍යාව වැඩි වෙමින් පවතී. ස්වාතිලන්තය සහ මැකෝනියාව සියළුම ප්‍රධාන අන්තර්ජාතික මානව හිමිකම් ලේඛන වල පාර්ශවකාර රාජ්‍යයන් වේ. එම රාජ්‍යයන්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන බව උපකල්පනය කරන්න.

පහත සඳහන් කරුණු වලට පිළිතුරු දෙන්න.

(අ) ස්වාතිලන්තයේ අන්තර්ජාතික මානව හිමිකම් බැඳියාවන් ඇසුරින් සොබා ගේ සරණාගත භාවයට කරන ලද ඉල්ලීම පිළිබඳව ස්වාතිලන්තය ට උපදෙස් දෙන්න.

(ආ) ස්වාතිලන්තය තුළ සොබා නීති විරෝධී සංක්‍රමණිකයෙකු වන්නේ නම් ඒ පිළිබඳව ඔබගේ මතය කුමක්ද?

(ඇ) ස්වාතිලන්තය ප්‍රධාන මානව හිමිකම් ලේඛන වලට සාමාජික රාජ්‍යයක් නොවන්නේ නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේ ද?

5. <u>(අ) සහ (ආ)</u> යන <u>දෙකටම</u> පිළිතුරු සපයන්න.

(අ) අන්තර්ජාතික මානව හිමිකම් නීතිය යටතේ කාන්තාවන්ට පූර්ණ නෛතික පිළිගැනීමක් පවතින අතර පුරුෂයන් හා සමාන තැන්හි ලා සැළකිය යුතුය. කෙසේ වුවත් කාන්තාවන් ජීවත්වන තත්ත්වයන්හි සැක සහිත භාවය සහ ඔවුන් බොහෝ මානව හිමිකම් භුක්ති විඳින ස්වභාවයේ මායාකාරී භාවය විසින් මේ පිළිබඳව දේශීය අධිකාරීන් සහ අන්තර්ජාතික විමර්ශන ආයතන දෙකොටසේයාශයම අතිශය සුවිශේෂී වගකීමක් මතුකර දී ඇත.

පශ්චාත් ගැටුම් සහිත සමාජ ඇසුරින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. අදාල අධිකාරීන් මඟින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ආ) සුළු ජනවාර්ගික සාමාජිකයන් හට එක් එක් රාජ්‍යයෙහි අධ්‍යාපන ප්‍රතිපත්තීන්ට අනුකූලව පාසල් පවත්වාගෙන යාම, තම භාෂාව භාවිතය සහ එම භාෂාවෙන් ඉගැන්වීම් කටයුතු කිරීම යන කරුණු අන්තර්ගත වන පරිදි ඔවුන්ගේ අධ්‍යාපනික කටයුතු සිදුකිරීමට අයිතිය ඇත්තේය. (1960 අධ්‍යාපනය විභේදනයට එරෙහි යුනෙස්කෝ සම්මුතිය)

බහුවාර්ගික සමාජයක අන්තර්ගෘහිත අධ්‍යාපන ක්‍රමය කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විමසන්න.

6. සවාර්ම රාජ්‍යය විසින් ගනු ලැබූ පහත තීරණ සම්බන්ධයෙන් රයිට් වොයිස් ව්‍යාපාරය විධායක අධ්‍යක්ෂක විසින් ඔබගේ උපදෙස් පතයි.

(අ) ස්වාර්ම රාජ්‍යයේ අවසරය ලද ආගමක පණිවිඩකරුවෙකුගේ පවුලක් වටා ගෙතුණු, තොරායා මහතා විසින් අධ්‍යක්ෂණය කරන ලද "පණිවිඩ කරුවාගේ අවසන් පරීක්ෂාව" නමැති චිත්‍රපටය, ස්වාර්ම ජාතික වාරණ මණ්ඩලය විසින් අවුරුදු 20 ට වැඩි ප්‍රේක්ෂකාගාරයක ට දර්ශනය කළ යුතුය සහ තෝරාගත් සිනමා ශාලාවල පමණක් ප්‍රදර්ශනය කළ යුතුය යන කොන්දේසි යටතේ ප්‍රදර්ශනය කිරීමට අවසර දුන් චිත්‍රපටයක් ලෙස ප්‍රදර්ශනය කිරීම පිළිබඳව.

(ආ) සමාජ විද්‍යාත්මක අධ්‍යාපනඥ කණ්ඩායම් දෙකක් විසින් ප්‍රාථමික සහ ද්විතීයික පාසල් සඳහා අනිවාර්ය ලිංගික අධ්‍යාපනය හඳුන්වා දිය යුතු බවට කරන ලද යෝජනාවක් ස්වාර්ම රාජ්‍යයේ ජාතික අධ්‍යාපන කොමිසම විසින් ප්‍රතික්ෂේප කිරීම.

(ඇ) ස්වාර්ම රාජ්‍යයේ අභ්‍යන්තර කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින්, දේශපාලනික විකට චිත්‍ර පුවත්පත්වල පළ කිරීම තහනම් කරමින් නිකුත් කරන ලද රෙගුලාසිය, සහ, එම රෙගුලාසිය උල්ලංඝනය කිරීම කිසිසේත්ම නොඉවසන අතර ඊට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගන්නා බවට කරන ලද ප්‍රකාශය.

(ඇ) ස්වාර්ම රාජ්‍යයේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් යෝජිත "එක සමාජයක් සහ ඒකීය සමාජ ක්‍රමයක්" නමැති ප්‍රතිපත්තිය මගින් ඕනෑම පරමාර්ථයක් උදෙසා එක්රැස්වීම, පුද්ගල ක්‍රියාකාරී සහයෝගීතා සංවිධාන නිර්මාණය කිරීම, තවත් කෙනෙකුගේ සංස්කෘතිය පරයා තම සංස්කෘතිය ප්‍රවර්ධනය සහ පෞරාණික සංස්කෘතික උරුම භූමියන්ට ඇතුළු වීම නැවත දැනුම් දෙන තුරු තහනම් කර ඇත

ස්වාර්ම රාජ්‍යයේ නීති ක්‍රමය ශ්‍රී ලංකාවේ නීති ක්‍රමයට සමාන බව උපකල්පනය කරමින් ඉහත සිදුවීම් අගයමින් ඔබගේ උපදේශාත්මක වාර්තාව සකසන්න.

7. මානව හිමිකම් කවුන්සලයේ 44 වැනි සමුළුවේදී "ශ්‍රී ලංකාව පිළිබඳ මධ්‍යගත කණ්ඩායම" විසින් මානව හිමිකම් කොමසාරිස්වරයාගේ වාර්ෂික වාර්තාව පිළිබඳ අන්තර් ක්‍රියාකාරී සාකච්ඡාවේ දී ඉදිරිපත් කළ මතයන්ට ප්‍රතිපිළිතුරු ලබා දෙමින්ද, කොවිඩ්-19 සම්බන්ධ වාචික ප්‍රකාශ නිකුත් කරමින් ද ශ්‍රී ලංකාවේ නියෝජිතවරිය දක්වා සිටියේ;
"2020 ජූනි 30 දා ශ්‍රී ලංකාවේ 30/1 යෝජනා සම්මතයන්ට පිළිබඳව මධ්‍යගත කණ්ඩායම (එක්සත් රාජධානිය, කැනඩාව, ජර්මනිය, උතුරු මැසිඩෝනියාව සහ මොන්ටෙනග්‍රෝ) විසින් ඉදිරිපත් කළ මතයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ප්‍රකාශ කරන්නේ ඉතා පැහැදිලි ලෙසට 30/1 යෝජනා සම්මතයේ නියෝජ්‍යත්වයෙන් තම රාජ්‍යය ඉවත් වුවද, ශ්‍රී ලංකාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලවත් රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූල වන්නාවූද දේශීය නිර්මිත හා ක්‍රියාත්මක වන්නාවූ ක්‍රියාදාමයකට අනුගතව තවදුරටත් සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ආරක්ෂා කිරීමට ඇප කැප වී සිටින බවයි."

රාජ්‍යයන් විසින් මානව හිමිකම් ආරක්ෂා කිරීමේ බැඳියාව, සහ කඩ නොකළ යුතු එනම් අලංඝනීයභාවය, රාජ්‍ය ස්වාධිපත්‍යය සහ දේශ භූමි අඛණ්ඩතාව යන තර්කයන් මත ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

ඔබේ පිළිතුර නඩු තීන්දු නීතිය සහ අධ්‍යනික අධිකාරීන් මගින් සනාථ කරන්න.